පරිසර අමාත්‍යාංශය

2023 ජාතික ඛනිජ ප්‍රතිපත්තිය පිළිබඳ මහජන අදහස් විමසීම

1999 දී සකස් කරන ලද ජාතික ඛනිජ ප්‍රතිපත්තිය ගෝලීය, ප්‍රාදේශීය සහ දේශීය වශයෙන් සිදුව ඇති වෙනස්කම් සැලකිල්ලට ගනිමින් වර්තමාන අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි යාවත්කාලීන කිරීමට අවශ්‍ය පියවර ගැනීම කාලීන අවශ්‍යතාවයකි. විශේෂයෙන් දැනට පවතින ජාතික ඛනිජ ප්‍රතිපත්තිය තුළ අඩංගු වී නොමැති "ඛනිජ සඳහා අගය එකතු කිරීම, නව තාක්ෂණික ක්‍රම භාවිතය තුළින් ඛනිජ සම්පත් ප්‍රශස්ථ ලෙස භාවිතය සහ එම සම්පත තිරසාර ලෙස කළමනාකරණය කිරීම, වර්තමාන ආර්ථික අභියෝගයන් සඳහා මුහුණ දීමට සුදුසු පරිදි ඛනිජ සම්පත සඳහා ප්‍රමුඛ ස්ථානයක් ලබාදීම" ආදී විෂය ක්ෂේත්‍රයන් වෙත මෙහිදී අවධානය යොමු විය යුතුය. මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පරිසර අමාත්‍යාංශය සහ භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශය එක්ව සියලු පාර්ශ්වකාර ආයතන වල සහභාගීත්වයෙන් 1999 දී සකස් කරන ලද ජාතික ඛනිජ ප්‍රතිපත්තිය යාවත්කාලීන කිරීමට පියවර ගනිමින් පවතී. ඒ අනුව මෙම සකස් කරන ලද ජාතික ඛනිජ ප්‍රතිපත්ති කෙටුම්පත සඳහා මහජන අදහස් ලබා ගැනීමට අපේක්ෂා කෙරේ.

මෙම කෙටුම්පත් කරන ලද ජාතික ඛනිජ ප්‍රතිපත්තිය මහජන අදහස් සඳහා පරිසර අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවිය වන www.env.gov.lk හරහා ප්‍රකාශයට පත්කර ඇත. මේ පිළිබඳව උනන්දුවක් දක්වන අයගෙන් අදහස් හා යෝජනා අපේක්ෂා කරන අතර ඔබගේ අදහස් හා යෝජනා 2023.05.29 හෝ ඊට පෙර පහත ලිපිනය හරහා හෝ විද්‍යුත් තැපෑල මගින් ලබා ගැනීමට පරිසර අමාත්‍යාංශය අපේක්ෂා කරයි.

තැපැල් ලිපිනය	:	අධ්‍යක්ෂ ස්වභාවික සම්පත් කළමනාකරණ අංශය පරිසර අමාත්‍යාංශය "සොබාදම් පියස" අංක 416/සී/1, රොබට් ගුණවර්ධන මාවත, බත්තරමුල්ල.
විද්‍යුත් තැපෑල	:	**dirlr@env.gov.lk / landresourcesl@gmail.com**
ෆැක්ස්	:	**011 2879975**

වෛද්‍ය අනිල් ජාසිංහ
ලේකම්
පරිසර අමාත්‍යාංශය

2023.04.28